**දඹුල්ල ප්‍රාදේශීය සභාව**

දෛනික වැටුප් ගෙවීමේ පදනම මත සේවයට බඳවා ගැනීම

දඹුල්ල ප්‍රාදේශීය සභාවේ විදුලි කාර්මික තනතුර සඳහා දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවකයන් බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

**විවෘත බඳවා ගැනීම :-**

**01. අධ්‍යාපන සුදුසුකම්** -: අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් විෂයන් 02කට සම්මාන සහිතව විෂයන් 06ක් සමත්ව තිබීම හෝ ජාතික වෘත්තීය සුදුසුකම්හි (NVQ)3 සුදුසුකම ලබා තිබීම.(රා.ප.ච 28/2016 අනුව)

**02. වෘත්තීය සුදුසුකම් :-**

(අ) වෘත්තියට අදාළව තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තිය කුසලතාවන්හි (NVQ ) 2 හෝ (NVQ) 3 මට්ටමේ නිපුණතාවක් ලබා තිබීම;

හෝ

(ආ) කාර්මික අධ්‍යාපනය හා පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ ( DTET) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතිකය ලබා තිබීම;

හෝ

(ඇ) ජාතික තරුණ සේවා සභාවේ (NYSC) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;

හෝ

(ඈ) ශ්‍රී ලංකා වෘත්තිය පුහුණු කිරීමේ අධිකාරියේ (VTA) වෘත්තියට අදාළව එක් වසරකට නොඅඩු පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;

හෝ

(ඉ) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුවේ (NAITA) වෘත්තියට අදාළව එක් වසරක පාඨමාලාවක් හදාරා සහතික ලබා තිබීම;

හෝ

(ඊ) තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි කාර්මික පුහුණු ආයතනයක වෘත්තියට අදාළව වසරකට නොඅඩු පාඨමාලාවක් සම්පූර්ණ කර සහතිකය ලබා තිබීම.

**සීමිත බඳවා ගැනීම :-**

- **අධ්‍යාපන සුදුසුකම්** :- ගරු ආණ්ඩුකාරතුමා විසින් 2021.11.12 දින අනුමත කරන ලද මධ්‍යම පළාතේ පළාත් පාලන ආයතනවල ප්‍රාථමික මට්ටමේ අර්ධ ශිල්පීය සේවක සේවයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය ක්‍රියාත්මක වන දින

වන විට මධ්‍යම පළාත් පළාත් පාලන සේවයේ ප්‍රාථමික සේවා ගණයට අදාළ ශිල්පීය නොවන ශ්‍රේණියක ස්ථිර පදනමින් බඳවාගෙන ඇති සේවකයින්ට ඔවුන් බඳවා ගන්නා ලද තනතුර සඳහා එවකට පැවැති බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් අධ්‍යාපන සුදුසුකම් අදාළ වේ. (එවකට බඳවා ගැනීමේ පටිපාටියෙහි බඳවා ගැනීමේ සුදුසුකම් ලෙස අ.පො.ස.සා.පෙළ සමත්විය යුතු බව දක්වා ඇත්තේනම් එවන් අවස්ථාවක ජාතික වෘත්තීය සුදුසුකම්හි NVQ3 සුදුසුකම් ලබා තිබීම ප්‍රමාණවත් වේ. රා.ප.ච.28/2016 අනුව)

- **වෘත්තීය සුදුසුකම්** :- මධ්‍යම පළාතේ පළාත් පාලන සේවයේ ප්‍රාථමික සේවා ගණයට අදාළ ශිල්පීය නොවන ශ්‍රේණියක ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක වසර 05ක හෝ ඊට වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම. (සේවය ස්ථිර කර තිබිය යුතුය.)

- **පළපුරුද්ද** :- අදාළ ක්ෂේත්‍රයේ අවුරුදු 02ක පළපුරුද්දක් ලබා තිබීම.

**03.** **බඳවා ගැනීමේ කොන්දේසි සහ පොදු සුදුසුකම් -:**

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු අතර විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

ii. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය. (දැනටමත් රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව බල නොපානු ඇත.)

iii. සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් සහ ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවකින් හා යහපත් චරිතයකින් යුක්ත විය යුතු අතර මධ්‍යම පළාතේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට සුදුසු ශරීර සෞඛ්‍යකින් යුක්ත තැනැත්තෙකු විය යුතුය.

iv. දඹුල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03 ක පදිංචිය සනාථ කිරීමට වසමේ ග්‍රාම නිලධාරීගේ සහතිකය ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතුය.

v. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී දඬුවම් ලැබුවෙකු නොවිය යුතු අතර රජයේ/ පළාත් රාජ්‍යය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුය.

vi. බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම්, එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

vii මෙම බඳවා ගැනීම තාවකාලිකය. අදාළ තනතුර සඳහා වන ගෙවීම් සභාව විසින් අනුමත කරන ලද දෛනික වැටුපකට යටත් වේ.

viii. මෙම තාවකාලික පත්කිරීම දඹුල්ල ප්‍රාදේශීය සභාවේ හෝ මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ වෙනත් තනතුරක් සඳහා අයදුම් කිරීමට සුදුසුකමක් නොවේ.

**04.** **බඳවා ගැනීමේ ක්‍රමය (සීමිත/ විවෘත) -:**

1. අයදුම්පත් ඉදිරිපත් කර ඇති හා බඳවා ගැනීමට අවශ්‍ය අවම සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලුම දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලැබේ.

2 . සම්මුඛ පරීක්ෂණයට ඉදිරිපත් වන අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු වී පවත්නා තනතුරු සංඛ්‍යාවට සමාන වඩාත් සුදුසුකම් සහිත අයදුම්කරුවන් සංඛ්‍යාවක් තෝරා ගෙන බඳවා ගැනීම සිදු කරනු ලැබේ.

**05.** **අයදුම් කළ යුතු ආකාරය -:**

- මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රය A4 ප්‍රමාණයේ කඩදාසිවල පමණක් සකස් කර, අයදුම්පත් 2026.04.20 වැනි දිනට හෝ එදිනට පෙර "ලේකම්, දඹුල්ල ප්‍රාදේශීය සභාව, සීගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.
- ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.
- දැනටමත් රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයේ අයදුම්කරුවන් තම ඉල්ලුම් පත්‍ර ආයතන ප්‍රධානියා මඟින් එවිය යුතුය.
- අයදුම්පත සමඟ පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අමුණා එවිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ දී මුල් සහතික හා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතුය.

i. උප්පැන්න සහතිකය;

ii. අධ්‍යාපන සහතික;

iii. පදිංචිය පිළිබඳ ප්‍රාදේශීය ලේකම්ගේ අනු අත්සන සහිත ග්‍රාම නිලධාරි සහතිකයක්;

iv. මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්. ( එකක් ග්‍රාම නිලධාරිවරයාගෙන් විය යුතුය);

v. වෘත්තිය පිළිබඳ සහතික;

vi. සේවා සහතිකය. (දැනටමත් රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයේ නියුතු වුවන්ට පමණි.)

06. මෙම අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ ඒ අතරතුර හෝ මෙම බඳවා ගැනීම් ප්‍රමාද කිරීම් හෝ වෙනස් කිරීම සහ මෙම නිවේදනය අවලංගු කිරීම ආදී බලතල දඹුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

ඒ. එල්. එස්. ප්‍රියදර්ශනී,
ලේකම්,
දඹුල්ල ප්‍රාදේශීය සභාව,
සීගිරිය.